(අන්තර්ජාල අනුවාදයකි.)

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

## 1999 අංක 54 දරන රණවිරු සේවා අධිකාරී පනත

[සහතිකය සටහන් කළේ 1999 දෙසැම්බර් මස 23 වැනි දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1999 දෙසැම්බර් මස 24 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 8.00 තැපැල් ගාස්තුව : රු. 3.50

[සහතිකය සටහන් කළේ 1999 දෙසැම්බර් මස 23 වැනි දින.]

එල්.ඩී.—ඕ. 4/99.

**සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ ආබාධිත බවට පත්ව සිටින සාමාජිකයන්ගේ සහ ක්‍රියාන්විතයේ දී මියගිය හෝ සොයා ගත නොහැකිව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගෙන් යැපෙන්නන්ගේ ශුභසාධනය ප්‍රවර්ධනය කිරීම පිණිස අධිකාරියක් පිහිටුවීම සඳහා ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා ද, විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1999 අංක 54 දරන රණවිරු සේවා අධිකාරිය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (1) (මෙහි මින් මතු "අධිකාරිය" යනුවෙන් හඳුන්වනු ලබන) රණවිරු සේවා අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන අධිකාරියක් පිහිටුවනු ලැබිය යුතු ය. රණවිරු සේවා අධිකාරිය පිහිටුවීම.

(2) අධිකාරිය, (1) වන උපවගන්තියෙන් එයට දී ඇති නාමයෙන්, අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් අධිකාරිය විසින් නඩු පැවරීම ද, අධිකාරියට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකි ය.

**3**. (1) අධිකාරියේ කටයුතු කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත, (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලයක් සතු විය යුතු ය. :— අධිකාරියේ කටයුතු පරිපාලනය කිරීම කළමනාකරණ මණ්ඩලයක් වෙත පැවරිය යුතු බව.

(අ) රාජ්‍ය ආරක්ෂක විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ ලේකම්වරයා විසින් නම් කරනු ලබන ඒ අමාත්‍යාංශයේ නියෝජිතයකු ;

(ආ) ස්වදේශ කටයුතු විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ ලේකම්වරයා විසින් නම් කරනු ලබන ඒ අමාත්‍යාංශයේ නියෝජිතයකු ;

(ඇ) ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අධ්‍යක්ෂ (ශුභසාධන කටයුතු) ;

(ඈ) ශ්‍රී ලංකා නාවික හමුදාවේ අධ්‍යක්ෂ (ශුභසාධන කටයුතු);

(ඉ) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධ්‍යක්ෂ (ශුභසාධන කටයුතු) ;

(ඊ) ශුභසාධන කටයුතු භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා ;

(උ) රාජ්‍ය ආරක්ෂක විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ සේවා වනිතා ඒකකයේ සභාපති ;

(ඌ) රාජ්‍ය ආරක්ෂක විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරිවරයා ;

(එ) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන මහා භාණ්ඩාගාරයේ නියෝජිතයකු ;

(ඒ) ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන වෙනත් සාමාජිකයන් තිදෙනකු ; ඒ සාමාජිකයන් අතුරෙන් යටත් පිරිසෙයින් සාමාජිකයන් දෙදෙනකු වෛද්‍ය වෘත්තියෙහි හා නිතීඥ වෘත්තියෙහි යෙදී සිටින සාමාජිකයන් අතුරෙන් විය යුතු ය. මේ ඡේදය යටතේ පත් කරනු ලබන සාමාජිකයකු මෙහි මින් මතු "පත් කළ සාමාජිකයා" යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) ජනාධිපතිවරයා විසින් මණ්ඩලයේ සාමාජිකයන් අතුරෙන් මණ්ඩලයේ සභාපතිවරයා සහ උපසභාපතිවරයා පත් කරනු ලැබිය යුතු ය.

(3) මේ පනතේ උපලේඛනයෙහි සඳහන් විධිවිධාන මණ්ඩලයේ පත් කළ සාමාජිකයන්ගේ ධුර කාලය, මණ්ඩලයේ සාමාජිකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික, මණ්ඩලයේ රැස්වීම් හා මණ්ඩලයේ මුද්‍රාව සම්බන්ධයෙන් බලපැවැත්විය යුතු ය.

අධිකාරියේ කර්තව්‍ය.

4. අධිකාරියේ කර්තව්‍ය –

(අ) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගේ පසු උවටැන සහ, ඔවුන් පුනරුත්ථාපනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම ;

(ආ) (i) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ට ; සහ

(ii) ක්‍රියාන්විතයේ දී මියගිය හෝ සොයාගත නොහැකිව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගෙන් යැපෙන්නන්ට ;

නිවාස සැපයීම සහ එහි ලා සහාය වීම ;

(ඇ) (i) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ට ; සහ

(ii) ක්‍රියාන්විතයේ දී මියගිය හෝ සොයාගත නොහැකිව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගෙන් යැපෙන්නන්ට

වෛද්‍ය පහසුකම් සැපයීම සහ එහි ලා සහාය වීම ;

(ඈ) (i) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ට ; සහ

(ii) ක්‍රියාන්විතයේ දී මියගිය හෝ සොයාගත නොහැකිව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගෙන් යැපෙන්නන්ට,

ශිෂ්‍යත්ව සහ වෙනත් ආකාරයේ උපකාර ලබා දීමෙන් ඔවුන්ට අධ්‍යාපනයට හා උසස් අධ්‍යාපනයට ප්‍රවේශය ලබාගැනීමට අවස්ථාව සලසා දීම ;

(ඉ) (i) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ට ; සහ

(ii) ක්‍රියාන්විතයේ දී මියගිය සහ සොයාගත නොහැකිව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගෙන් යැපෙන්නන්ට,

ඵලදායී සේවානියුක්තියක් සුරක්ෂිත කිරීමෙහි ලා සහාය වීම ;

(ඊ) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ට සේවා නියුක්තිය සැලසීමේ අරමුණ ඇතිව කාර්මික, කෘෂිකාර්මික හෝ වාණිජ ව්‍යවසායයන් පිහිටුවීම ; සහ

(උ) අධිකාරියේ කර්තව්‍ය සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ හිතකර සියලු ක්‍රියා හා දේ කිරීම.

මණ්ඩලයේ බලතල.

**5.** මණ්ඩලයේ කර්තව්‍ය කිරීමේ කාර්ය සඳහා –

(අ) යම් චංචල හෝ නිශ්චල දේපළ අත්කර ගැනීමට හා දැරීමට සහ ඒ චංචල හෝ නිශ්චල දේපළ විකිණීමට, බදුදීමට, උකස් කිරීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට ;

(ආ) මණ්ඩලයේ කර්තව්‍ය කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලු ගිවිසුම්වලට ඇතුළත් වීමට ;

(ඇ) යම් බැංකුවක හෝ බැංකුවල ජංගම, ඉතිරිකිරීමේ හෝ තැන්පතු ගිණුම් විවෘත කිරීමට, ක්‍රියාත්මක කිරීමට හා පවත්වා ගෙන යාමට ;

(ඈ) මණ්ඩලයේ කර්තව්‍ය කිරීමෙහි ලා අවශ්‍ය නිලධරයන් හා සේවකයන් සේවයෙහි නියුක්ත කිරීම ; සහ ඒ නිලධරයන් හා සේවකයන් විෂයයෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීමට ;

(ඉ) (ඈ) ඡේදය යටතේ පත් කරන ලද නිලධරයන්ගේ සහ සේවකයන්ගේ සේවා නියම හා කොන්දේසි තීරණය කිරීමට ;

(ඊ) මණ්ඩලයේ කර්තව්‍ය කිරීමෙහි ලා අවශ්‍ය හෝ ආනුෂංගික වෙනත් සියලු ක්‍රියා හෝ දේ කිරීමට,

මණ්ඩලයට බලය තිබිය යුතු ය.

නාමලේඛන.

**6**. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවීමේ දින සිට දින හැටක් ඇතුළත අධිකාරිය විසින් පිළිවෙළින් –

(අ) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සියලු ම සාමාජිකයන් ; සහ

(ආ) ක්‍රියාන්විතයේ දී මියගිය හෝ සොයා ගත නොහැකිව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සියලු සාමාජිකයන්ගෙන් යැපෙන්නන්,

පිළිබඳ නාමලේඛන පිළියෙල කිරීමට කටයුතු සැලැස්විය යුතු අතර, ඒ නාමලේඛන ප්‍රතිශෝධනය කිරීම හෝ සංශෝධනය කිරීම අවශ්‍ය වන පරිදි හා අවශ්‍ය වන විටක එසේ කිරීමට ද කටයුතු සැලැස්විය යුතු ය.

අධිකාරියේ කාර්ය මණ්ඩලය.

7. (1) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු, මණ්ඩලයේ ඉල්ලීම පිට, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව, මණ්ඩලය විසින් එවැනි ම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන යම් කාලයක් සඳහා අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය ; නැතහොත් එවැනි ම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක , 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) යම් නිශ්චිත කාලයක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වී ඇති යම් තැනැත්තකු අධිකාරිය විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තා විසින් අධිකාරියට කරනු ලබන යම් සේවා කාලයක්, ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරන ලද සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

අධිකාරියේ අරමුදල.

8. (1) අධිකාරියට (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) අධිකාරියේම අරමුදලක් තිබිය යුතු ය.

(2) අධිකාරියට –

(අ) පාර්ලිමේන්තුව විසින් අධිකාරියේ කාර්ය සඳහා විසර්ජනය කරනු ලබන සියලු මුදල් ;

(ආ) 4 වන වගන්තියේ (ඊ) ඡේදය මගින් අධිකාරියට වෙන් කර දී ඇති කර්තව්‍ය කිරීමෙහි ලා පිහිටුවා ඇති ව්‍යාවසාය වලින් ලාභ වශයෙන් අධිකාරියට ලැබිය හැකි සියලු මුදල් ;

(ඇ) දේශීය හෝ විදේශීය ප්‍රභවයන්ගෙන් ත්‍යාග, ප්‍රදාන හෝ පරිත්‍යාග වශයෙන් අධිකාරියට ලැබිය හැකි සියලු මුදල්,

ගෙවනු ලැබිය යුතු ය.

(3) අධිකාරියේ කර්තව්‍යය කිරීමෙහි ලා වියදම් කිසිවක් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය කිරීම.

**9**. (1) අධිකාරියේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) මණ්ඩලය විසින් අධිකාරියේ ආදායම් හා වියදම, වත්කම් හා බැරකම් සහ අධිකාරියේ අනෙකුත් සියලු ගණුදෙනු පිළිබඳව නිසි ගිණුම් පොත් තබා ගැනීමට සැලැස්විය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීම හා සම්බන්ධ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, අධිකාරියේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

ඇතැම් බදු වලින් නිදහස් කිරීම.

**10**. (1) අධිකාරියේ සියලු ලාභ සහ ආදායම, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත යටතේ ආදායම් බද්දෙන් නිදහස් විය යුතු ය.

(2) අධිකාරිය වෙත මුදලින් හෝ අන්‍යාකාරයකින් ලැබෙන සෑම ත්‍යාගයක් ම, ප්‍රදානයක් ම හෝ පරිත්‍යාගයක් ම, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 31 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ කාර්ය සඳහා, ආණ්ඩුව විසින් පිහිටුවන ලද අරමුදලකට මුදලින් හෝ අන්‍යාකාරයකින් කරන ලද පරිත්‍යාගයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

අධිකාරියේ සාමාජිකයන්, නිලධරයන් හා සේවකයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

**11**. මණ්ඩලයේ සියලු සාමාජිකයන් සහ අධිකාරියේ නිලධරයන් සහ සේවකයන්, දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

අධිකාරිය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් විය යුතු බව.

**12**. අධිකාරිය, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

මේ පනත යටතේ හෝ අධිකාරියේ විධානය මත හෝ කරන ලද ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව.

**13**. (1) (අ) මේ පනත යටතේ අධිකාරිය විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් අධිකාරියට විරුද්ධව ; හෝ

(ආ) මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත මණ්ඩලයේ සාමාජිකයකු විසින් හෝ අධිකාරියේ නිලධරයකු හෝ සේවකයකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැ යි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයාට, නිලධරයාට හෝ සේවකයාට විරුද්ධව,

කිසිම සිවිල් නඩුවක් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) අධිකාරිය විසින් හෝ අධිකාරියට විරුද්ධව හෝ අධිකරණයක් ඉදිරියෙහි ගෙනෙනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී අධිකාරිය විසින් දරන ලද යම් වියදමක්, අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී අධිකාරියට ගෙවන ලද හෝ අධිකාරිය විසින් අය කර ගන්නා ලද ගාස්තු කිසිවක් අධිකාරියේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයෙහි සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත හෝ කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන්, ඒ තැනැත්තාට විරුද්ධව යම් අධිකරණයක් ඉදිරියෙහි පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී, ඒ තැනැත්තා විසින් දරන ලද වියදම් කිසිවක්, ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලදැයි අධිකරණය තීරණය කරන්නේ නම්, ඒ තැනැත්තාට අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

රජයේ දේපළ අධිකාරියට ලබාදිය යුතු බව.

**14.** (1) අධිකාරියේ යම් කාර්යයක් සඳහා රජයේ යම් නිශ්චල දේපළක් අවශ්‍ය වන අවස්ථාවක, ඒ කාර්යය රජයේ ඉඩම් ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ විශේෂ ප්‍රදානයක් හෝ බදුදීමක් කළ හැකි කාර්යයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව, අධිකාරිය වෙත කරනු ලබන, ඒ දේපළෙහි විශේෂ ප්‍රදානයකට හෝ බදු දීමකට ඒ ආඥාපනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

(2) අධිකාරියේ යම් කාර්යයක් සඳහා රජයේ යම් චංචල දේපළක් අවශ්‍ය වන අවස්ථාවක, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් ඒ චංචල දේපළෙහි සන්තකය හා පාවිච්චිය අධිකාරිය වෙත පවරා සතු කර දෙනු ලැබිය හැකි ය :

එසේ වුව ද, රජයේ යම් චංචල දේපළක් කෙරෙහි බලපාන කිසිම නියමයක්, ඒ දේපළ විෂයයෙහි පාලනය ඇති අමාත්‍යවරයාගේ එකඟත්වය නොමැතිව, අමාත්‍යවරයා විසින් මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ කරනු නොලැබිය යුතු ය.

වාර්ෂික වාර්තාව.

**15**. එක් එක් මුදල් වර්ෂය අවසානයේ දී ඒ ඒ වර්ෂය තුළ අධිකාරියේ කටයුතු පිළිබඳ වාර්තාවක් මණ්ඩලය විසින් පිළියෙල කර, ඒ වාර්තාව අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. අමාත්‍යවරයා විසින් ඒ වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට සලස්වනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**16**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

**17**. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ –

"සන්නද්ධ හමුදා" යන්නෙන්, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව, ශ්‍රී ලංකා නාවුක හමුදාව හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාව අදහස් වේ ;

"යැපෙන්නා" යන්නට, එය ක්‍රියාන්විතයේ දී මියගිය හෝ සොයා ගත නොහැකිව සිටින සන්නද්ධ හමුදාවල හෝ පොලිස් හමුදාවේ සාමාජිකයකු සම්බන්ධයෙන් යෙදෙන විට, ඒ සාමාජිකයාගේ වැන්දඹු භාර්යාව හෝ වැන්දඹු පුරුෂයා, රැකියාවක් නොමැති සහ අවිවාහක දියණිය, රැකියාවක් නොමැති පුතා, දෙමව්පියන්, වයස අවුරුදු දහ අටට අඩු අවිවාහක සහෝදරිය හෝ අවිවාහක සහෝදරයා සහ සීයා සහ ආච්චි ඇතුළත්වන අතර, දෙමවුපියන් ජීවත්ව නොසිටින අවස්ථාවක ඒ සාමාජිකයා මිය ගිය හෝ ක්‍රියාන්විතයේ දී සොයාගත නොහැකි බවට පත් වූ අවස්ථාවේ දී ඔහුගේ මාමා හෝ නැන්දා ඔහුගෙන් යැපෙන්නන් ලෙස සිටියේ නම්, ඒ මාමා සහ නැන්දා ද එයට ඇතුළත් වේ ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, යම් මහනගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර,ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන, ඉටු කරන හෝ කරන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හා කිරීම සඳහා යම් නීතියක් මගින් හෝ නීතියක් යටතේ ඇති කොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරියක් ද ඊට ඇතුළත් වේ ;

"පොලිස් හමුදාව" යන්නෙන්, ශ්‍රී ලංකා පොලිස් හමුදාව අදහස් වේ ;

"පළාත් සභාව" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVII අ වන පරිච්ඡේදය මගින් පිහිටුවන ලද පළාත් සභාවක් අදහස් වේ.

උපලේඛනය [**3 (3)** වන වගන්තිය]

1. යම් තැනැත්තකු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභාවක මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් හෝ එසේ පත් වේ නම් ඒ තැනැත්තා මණ්ඩලයේ පත් කළ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ එසේ කටයුතු කර ගෙන යාමට නුසුදුස්සකු විය යුතු ය.

2. මණ්ඩලයේ පත් කළ සාමාජිකයකුගේ ධූර කාලය 3 වන හා 4 වන ඡේදවල විධිවිධානවලට යටත්ව අවුරුදු හතරක් විය යුතු ය :

එසේ වුව ද, මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ධූරයෙන් ඉවත් කරනු ලැබීමෙන් ධූරය අත්හැර ඇති පත් කළ සාමාජිකයකු වෙනුවට පත් කරනු ලැබූ තැනැත්තකු, තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධූර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධූර දැරිය යුතු ය.

3. මණ්ඩලයේ පත් කළ සාමාජිකයකු විසින් තත්කාර්ය සඳහා ජනාධිපතිවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ස්වකීය ධූරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ඒ ඉල්ලා අස්වීම ජනාධිපතිවරයා විසින් ලියවිල්ලකින් භාරගනු ලැබීමේ දී බලාත්මක විය යුතු ය.

4. ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන නියමයක් මගින් ජනාධිපතිවරයා විසින් හේතු දක්වා මණ්ඩලයේ පත් කළ සාමාජිකයකු ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය. මේ ඡේදය යටතේ නියමයක් කරනු ලැබුවේ යම් සාමාජිකයකු සම්බන්ධයෙන් ද, ඒ සාමාජිකයා විසින්, ගැසට් පත්‍රයෙහි ඒ නියමය පළ කරනු ලැබූ දින සිට ධූරය අත්හරිනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

5. රෝගාතුරවීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් හේතුවක් නිසා මණ්ඩලයේ පත් කළ සාමාජිකයකුට ස්වකීය ධූරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා ජනාධිපතිවරයා විසින් වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

6. ජනාධිපතිවරයා විසින් හේතු දක්වා කවර වූ හෝ අවස්ථාවක සභාපතිවරයා සහ උපසභාපතිවරයා, පිළිවෙලින් සභාපති ධූරයෙන් හෝ උපසභාපති ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

7. සභාපතිවරයාගේ හෝ උපසභාපතිවරයා විසින් තත්කාර්ය සඳහා ජනාධිපතිවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ඕනෑම අවස්ථාවක, පිළිවෙලින් සභාපති ධූරයෙන් හා උපසභාපති ධූරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ඒ ඉල්ලා අස්වීම ජනාධිපතිවරයා විසින් ලියවිල්ලකින් භාරගනු ලැබීමේ දී බලාත්මක විය යුතු ය.

8. 6 වන සහ 7 වන ඡේදවල විධිවිධානවලට යටත්ව, සභාපතිවරයාගේ සහ උපසභාපතිවරයාගේ ධූරකාලය පිළිවෙලින් ඔවුන් මණ්ඩලයේ සාමාජිකත්වය දරන කාලය විය යුතු ය.

9. මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා ජනාධිපතිවරයා විසින් නිශ්චය කරනු ලබන යම් පාරිශ්‍රමිකයන්, මණ්ඩලයේ සාමාජිකයන් සියලු දෙනාට ම හෝ එකී යම් සාමාජිකයකුට හෝ ගෙවනු ලැබිය හැකි ය.

10. මණ්ඩලයේ සභාපතිවරයා පැමිණ සිටී නම්, ඔහු සෑම රැස්වීමක දී ම මූලාසනය දැරිය යුතු ය. යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති විටක, උපසභාපතිවරයා ඒ රැස්වීමේ මූලාසනය දැරිය යුතු ය. එවැනි යම් රැස්වීමකට සභාපතිවරයා සහ උපසභාපතිවරයා යන දෙදෙනා ම පැමිණ නොමැති විටක, පැමිණ සිටින සාමාජිකයන් විසින් ඔවුන් අතුරෙන් එක් සාමාජිකයකු ඒ රැස්වීමේ මූලාසනය දැරීම සඳහා තෝරා පත් කර ගනු ලැබිය යුතු ය.

11. මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් අටදෙනෙකු විය යුතු ය.

12. මණ්ඩලයේ යම් රැස්වීමක මූලාසනය දරන තැනැත්තාට ස්වකීය ඡන්දයට අතිරේකව තීරක ඡන්දයක් ද තිබිය යුතු ය.

13. 10 වන සහ 11 වන සහ 12 වන ඡේදවල විධිවිධානවලට යටත්ව, මණ්ඩලය විසින් එහි රැස්වීම් සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම සම්බන්ධයෙන් කාර්ය පටිපාටිය විධිමත් කරගනු ලැබිය හැකි ය.

14. අධිකාරියේ මුද්‍රාව මණ්ඩලය විසින් නිශ්චය කොට සකස් කර ගත හැකි අතර, එය මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකින් වෙනස් කරනු ලැබිය හැකි ය.

15. අධිකාරියේ මුද්‍රාව මණ්ඩලය විසින් කලින් කල නිශ්චය කරනු ලබන යම් තැනැත්තකුගේ භාරයෙහි තිබිය යුතු ය.

16. අධිකාරියේ මුද්‍රාව, මණ්ඩලයේ අනුමතය ඇතිව හා මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයකට හෝ ලේඛනයකට තබනු නොලැබිය යුතු අතර, ඒ සාමාජිකයන් දෙදෙනා ම විසින් තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් ඒ සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් තබනු ලැබිය යුතු ය.

17. මණ්ඩලයේ සාමාජිකයින් අතර යම් පුරප්පාඩුවක් හෝ එහි සාමාජිකයන් අතුරෙන් යම් සාමාජිකයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක්, මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු වන්නේ යයි සලකනු නොලැබිය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.